# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/27 - 2017 මැයි මස 31 වැනි බදාදා - 2017.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2016

**1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 12 වැනි සහ 13 වැනි වගන්ති සමඟ කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාව මගින් සාදන ලද රීති.

සභාපති,
ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ ජාතික සභාව.

2017 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මෙම රීති, 2017 අංක .... දරන සුදු සැරයටි රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තෙකු සඳහා ඔවුන්ගේ අනන්‍යතාවය සහ ආරක්ෂාව නිරූපණය කිරීමට සුදු සැරයටියක් රැගෙන යාම හෝ භාවිත කිරීම සුදුසු වේ.

එසේ වුවද, මෙහි ඇතුළත් කිසිදු රීතියක් මගින් එවැනි සැරයටියක් රැගෙන නොයන අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තකු වෙත යම්කිසි ලිඛිත නීතියක් මගින් ප්‍රදානය කර ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාද අහිමි වන ලෙස තේරුම් නොගත යුතු ය.

3. සුදු සැරයටියක් භාවිත කරන අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තෙකු විසින් ඔහුගේ දෘශ්‍යාබාධිත බව තහවුරු කෙරෙන සාක්ෂියක් ලෙසින් වෛද්‍ය වාර්තාවක් රැගෙන යා හැකි ය.

4. (අ) අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තකු විසින් කෙළවර රතු පැහැති දිග සුදු සැරයටියක් භාවිත කරනු ලැබිය හැකි ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) (ආ) ඡේදයේ සඳහන් කරනු ලැබූ, භාවිතා කරන්නාට තමා ඉදිරියේ ඇති ප්‍රදේශය සංචාලනය කිරීමට උපකාරී විය හැකි සැරයටි වර්ග-

(i) අනම්‍ය ; හෝ

(ii) නමා ඇකිළිය හැකි,

සැරයටි වේ.

(ඇ) භාවිත කරනු ලබන සුදු සැරයටි වර්ගය, තැනැත්තාගේ දෘශ්‍යාබාධයේ ස්වරූපය, වයස, උස සහ වෙනත් විශේෂිත අවශ්‍යතා මත පදනම් විය හැකි ය.

(ඈ) සහතික ලත් දිශානතිය සහ චලතාව පිළිබඳ විශේෂඥවරයෙකු විසින් සැරයටිය භාවිතා කිරීම සඳහා පුහුණුව සහ සංචරන කුසලතා සඳහා පුහුණුවක් ලබා දෙනු ලැබිය හැකි ය.

5. අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තෙකු සුදු පැහැයෙන් යුත් හෝ කෙළවර රතු පැහැයෙන් යුත් සුදු සැරයටියක් ඔසවන ලද හෝ දිගු කරන ලද ආකාරයෙන් රැගෙන පාර හරහා යාමට හෝ පාර මාරු වීමට උත්සහ කරන ඕනෑම අවස්ථාවක, එම ස්ථානයට ළඟා වන සෑම වාහනයකම රියදුරු විසින් එවන් පදිකයින් අනතුරුවලට ලක්වීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ආරක්ෂිත පියවර ගත යුතු ය.

6. (අ) අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තන්හට යහපත් ශාරීරික තත්වයෙන් යුත් තැනැත්තන් භාවිතා කරන්නා වූ වීදි, මහා මාර්ග, පදික වේදිකා, පොදු ගොඩනැගිලි, පොදු පහසුකම් සහ අනෙකුත් පොදු ස්ථාන පූර්ණ හා නිදහස් ලෙස ඒ හා සමානව භාවිත කිරීමට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(ආ) නීතියෙන් ස්ථාපිත වූ ඕනෑම කොන්දේසියකට හෝ සීමාවකට යටත්ව සහ සියලු තැනැත්තන් හට අදාළ වන සියලු පොදු ප්‍රවාහන, ගුවන් යානා, මෝටර් වාහන, දුම්රිය මාර්ග, දුම්රිය, මෝටර් බස් රථ, ට්‍රෑම් රථ, බෝට්ටු හෝ අනෙකුත් පොදු වාහන හෝ ප්‍රවාහන ක්‍රම, හෝටල්, නවාතැන් පලවල්, පොදු නවාතැන්, විනෝද හෝ විවේක ස්ථාන සහ සාමාන්‍ය ජනයා හට ප්‍රවේශ විය හැකි අනෙකුත් ස්ථාන වල පූර්ණ හා සමාන නවාතැන්, වාසි, පහසුකම් සහ ප්‍රතිලාභ සඳහා අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තන්ට ද හිමිකමක් තිබිය යුතු ය.

(ඇ) අන්ධ හෝ දෘශ්‍යාබාධිත තැනැත්තන් හට සමාජයේ අනෙකුත් සාමාන්‍ය ජනයාට මෙන් නීතියෙන් ස්ථාපිත වූ කොන්දේසි හා සීමාවන්ට යටත්ව, බද්දට හෝ කුලියට ලබා දෙන ලද සියලු නිවාස හා වාසස්ථාන වෙත සම්පූර්ණ සහ සමාන ලෙස ප්‍රවේශයක් ලබා ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

7. මෙම රීතිවල කාර්ය සඳහා,

''දෘශ්‍යාබාධිත'' යන්නෙන් ප්‍රමිතිගත කාච සහ ස්පර්ශ කාච මගින් නිවැරදි කළ නොහැකි පෙනීමේ අඩු වීම අදහස් වන අතර එය නිශ්චිත හෝ සියලු කාර්යයන්හි නියැලීමට තැනැත්තන් හට ඇති හැකියාව අඩු කරයි. එයට,

(i) පැහැදිලි හා ප්‍රත්‍යක්ෂ ලෙස ප්‍රතිබිම්බ දැකීමට ඇති නොහැකියාව ;

(ii) දෘෂ්ටි ක්ෂේත්‍රය අහිමි වීම ;

(iii) දීප්තිමත්බවේ කුඩා වෙනස්කම් අනාවරණය කර ගැනීමට ඇති නොහැකියාව ;

(iv) වර්ණාන්ධතාව ; සහ

(v) ආලෝක සංවේදීතාව ද.

ඇතුළත් වේ.

06-487

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.